# කොලඹින් විද්‍යාලංකාරයට

අපේ රටේ ඇත්තේ සිංහල බෞද්ධයන්ට හා සිංහල බුද්ධාගමට එරෙහි වූ කුමන්ත්‍රණයක් ද? මෙරට සිංහල බෞද්ධ උගතුන් ක්‍රියා කරන්නේ, ලියන්නේ, කතා කරන්නේ සිංහල ජාතිය හා බුදු සසුන නැති කිරීමට බටහිරයන් ක්‍රියා කරන්නේය යන්න පෙරදැරි කරගනිමින් ද? මුළු මහත් බටහිර ක්‍රිස්තියානි ලෝකයම සිංහලයන් නැති කිරීමට, සිංහල සංස්කෘතිය විනාශ කිරීමට කුමන්ත්‍රණය කරමින් සිටින්නේ ද? මේ ප්‍රශ්න මෙසේ ඇසීමට සිදු වී ඇත්තේ සිංහලත්වය නුරුස්සන්නාවූ ද, බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයේ ඒජන්තයන් වූ ද මෙරට  උගතුන් යැයි සම්මත පිරිසක් මෙවැනි ප්‍රශ්නවලට ඔව් යැයි පිළිතුරු දෙමින්, ඒ පිළිතුරු උපකල්පනය කරමින් ඒ අනුව ලියන කියන බැවිනි. පසුගිය දා සති අන්ත පුවත්පතකට ලියූ ඇංකර අනුකාරකයෙක් ද නැවතත් එවැනි උපකල්පන සහිත ව තම බොරු ශාස්ත්‍රීය ලිපිය ලියා ඇත. බටහිර සමාජයීය විද්‍යාඥයන් (මෙරට අනුකාරකයන් නොව බටහිර වසන ඔවුන්ගේ ස්වාමිවරු -  මෙරට අනුකාරකයන්ට නිර්මාණය කරගත හැකි සංකල්පයක් නැත) නිර්මාණය කර ඇති සංකල්ප වචන පමණක් බව දැන ගැනීමට බටහිර ගණිතඥයන් හා භෞතික විද්‍යාඥයන් නිර්මාණය කර ඇති සංකල්ප හැදෑරිය යුතු ය. අඩුම තරමින් බටහිර ගණිතඥයෝ හා භෞතික විද්‍යාඥයෝ ගැඹුරු සංකල්ප නිර්මාණය කරති. බටහිර භෞතික විද්‍යාව පිටුපස නොණ්ඩි ගසන බටහිර සමාජයීය විද්‍යාඥයන්ට නිර්මාණය කරගත හැකි ගැඹුරු සංකල්පයක් නැත. ඔවුහු බොරු වචන හරඹයක යෙදී සිටිති. මේ සඳහා හොඳම උදාහරණය බටහිර පශ්චාත්නූතනවාදීහු වෙති. මෙයින් මා අදහස් කරන්නේ මෙරට අනුකාරකයන් නොවේ. ඔවුන්ට ඔවුන්ගේ ම වූ වචන හරඹයක්වත් නැත.

ජයදේව උයන්ගොඩට අනුව අප වැඩ කරන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය විනාශ කිරීමට බටහිරයන් ක්‍රියා කරන්නේය යන පදනමේ පිහිටමිනි. මොහු අනගාරික ධර්මපාලතුමා අනුව තම නම වෙනස්කර ගත්තෙකි. එහෙත් අනගාරික ධර්මපාලතුමා විවේචනය කරන්නෙකි. බොරු ප්‍රජාතන්ත්‍රවාදයක් වෙනුවෙන් පෙනී සිටින මොහු අඩුම තරමින් වෘත්තීය සමිති අයිතීන් පවා සාමාජිකයන්ට දීමට විරුද්ධ වූවෙකි. කොළඹ විශ්ව විද්‍යාලයෙන් මා අස්කළ විට මගේ පැමිණිල්ල මා සාමාජිකත්වය දැරූ වෘත්තීය සමිතිවලට (එක් සමිතියක මම සභාපතිත්වය දැරීමි. අනෙක් සමිතියෙහි කලක් ලේකම් ධුරය දරා සිටියෙමි. මුළු මහත් වෘත්තීය සමිති සම්මේලනයේ සභාපතිත්වය ද මම එකල දැරීමි.) ඉදිරිපත් කිරීමට මට අවස්ථාවක් ලබා නොදීමට මොහු සහ තවත් අය ක්‍රියා කළහ. නඩු හබ හා පාර්ලිමේන්තු කමිටු හරහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විශ්ව විද්‍යාල කථිකාචාර්ය ධුරයකට මා සුදුසු යැයි තීරණය කර තිබිය දී අද පවා කොළඹ විශ්ව විද්‍යාලය මගේ දේශනයකට සවන් දීමට එහි සිසුන්ට ඇති අයිතියට ඉඩ නොදෙයි. (අයිතිය යන්න බටහිර අදහසකි. ඇංකරයන්ට තේරුම් ගැනීම සඳහා පමණක් ඒ වචනය යොදා ගනිමි.) ශිෂ්‍ය සංගම් (ඊනියා මහා ශිෂ්‍ය සංගමය නොව බෞද්ධ ශිෂ්‍ය සංගමය වැනි සංගම්) මගේ දේශන සංවිධානය කළ විට විශ්ව විද්‍යාල බලධාරීහු ඉතා අත්තනෝමතික ලෙස ඒ දේශනවලට ඉඩ නොදෙති. දෙමළ ජනතාවගේ ඊනියා අයිතිය සිංහල බෞද්ධයන් විසින් නැති කෙරෙන්නේ යැයි මොර දෙන ඇංකරයෝ තම විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ට ඇති අයිතිය සම්බන්ධයෙන් නිහඬ වෙති. සමහර විට බෞද්ධ ශිෂ්‍ය සංගමය වැනි සංගම්වලට එවැනි අයිතියක් තිබිය යුතු නැතැයි ඔවුන් සිතනවා විය හැකි ය. මේ ඇංකරයන්ට අනුව සිංහල බෞද්ධයන්ට මේ රටේ තිබිය යුතු අයිතියක් නැත. අවසානයේ දී සිනහසෙන්නා හොඳට ම සිනහසෙයි යන අදහස රැගත් වන් හූ ලාෆ්ස් ලාස්ට් ලාෆ්ස් බෙස්ට් යනුවෙන් ඇංකරයන්ට තේරෙන ඉංගිරිසි කියමනක් වෙයි. මම තවම සිනහසීමට පටන් නොගත්තෙමි. එහෙත් මම නොහඬන්නෙමි.

උයන්ගොඩ ලියන කඩමාල්ලට ම ලියන ඔහුගේ ම ඥාතියකු වූ ඇංකරයෙක් මා බුද්ධිමතකු ලෙස හඳුන්වා තිබුණි. නැත, මම බුද්ධිමතෙක් නොවෙමි. මේ රටේ සිටින ඇංකර බුද්ධිමතුන් දෙස බලන විට බුද්ධිමතකු යැයි තමන් හඳුන්වාගන්නකු ගැන කිව හැක්කේ කුමක් ද? මම තෙරුවන් සරණ ගිය ගැමි උපාසකයෙක් පමණක් වෙමි. (ගැමිකම තීරණය වන්නේ යමකු ජීවත්වන ප්‍රදේශයෙන්වත්, ඉගෙනගත් හෝ නොගත් පාසල්වලින්වත්, විශ්ව විද්‍යාලවලින්වත්, කරන හෝ නොකරන රැකියාවෙන්වත් නොව ආකල්පවලින් හා දර්ශනයෙනි. චින්තනයෙනි.) මෙරට ප්‍රශ්නය වී ඇත්තේ උපාසකයන්ට අවශ්‍ය පරිදි කතා කිරීමට ලිවීමට හා ක්‍රියා කිරීමට බටහිර මතවාද විසින් ඉඩ නොදෙනු ලැබීම ය. උපාසකයා යනු නවගුණ වැල අතට ගත්තකු බවට පත්කර තිබෙන්නේ අධිපතිවාදී බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය විසිනි. මහෞෂධ පඬිතුමා කේවට්ටයාගේ හොම්බෙන් ලේ ගලන තුරු ඒ බමුණු කඩමාල්ලාගේ හොම්බ බිම ඇතුල්ලූ

© Prof. Nalin De Silva

බවත් එතුමා පසුව ලොව්තුරා බුදු වූ බවත් සිංහල බෞද්ධයෝ දනිති. මෙයින් අදහස් කරන්නේ සිංහල බෞද්ධයන් හිංසාකාරී විය යුතු බව නොවේ. එහෙත් ඔවුන් අසාධාරණය හමුවේ වැඳ වැටිය යුතු නොවේ.

මේ රටේ සිංහල බෞද්ධයන්ට විරුද්ධ ව කුමන්ත්‍රණයක් නැත. ඇත්තේ කුමන්ත්‍රණ ය. මේ කුමන්ත්‍රණ ඒ ඒ සිද්ධි අරභයා කෙරෙන ක්‍රියාවන් වෙයි. ඒ කුමන්ත්‍රණ යනු මහා ක්‍රියාදාමයක කුඩා කොටස් පමණක් වෙයි. බටහිරයෝ සිංහල බෞද්ධ සංස්කෘතිය විනාශ කිරීමට කටයුතු නොකරති. ඔවුහු ක්‍රිස්තියානි හැරෙන්නට කතෝලික ද ඇතුළු සියළු සංස්කෘති විනාශ කරති. කලින් කී කුමන්ත්‍රණ මේ විනාශය සඳහා යොදාගන්නා උපාමාර්ග වර්ගයක් පමණක් වෙයි. මේ විනාශ කිරීම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයේ අංගයකි. සංස්කෘතික යටත්විජිතවාදය බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ එක් කොටසක් වෙයි. එය මාක්ස්වාදීන්ගේ ද සහාය ලබන කොටසකි. බටහිර සමාජයීය විද්‍යාඥයෝ, ප්‍රගතිශීලි යැයි කියන්නෝ ද, බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය නොහඳුනති. මෙතරම් භයානක හානිකර යටත්විජිතවාදයක් ලෝකයේ ඉන් පෙර තිබී නැත. මේ යටත්විජිතවාදයේ අංග තුනක් වෙයි. ඒ දේශපාලන, සංස්කෘතික හා ආර්ථික යනුවෙනි. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ අරමුණ හා අභිලාෂය මුළු ලොවම එකම දේශපාලන අධිකාරයක්, ආර්ථික ව්‍යුහයක් හා සංස්කෘතික ආධිපත්‍යයක් යටතට පත් කිරීම ය. එකම සංස්කෘතික ආධිපත්‍යයක් යටතට පත්කෙරෙන්නේ බටහිර ක්‍රිස්තියානි හැරෙන්නට අනෙක් සංස්කෘතීන් විනාශ කිරීමෙනි. අප විරුද්ධ වන්නේ මේ ආධිපත්‍යයට හා විනාශයට ය. අපි මුළු මහත් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට ම විරුද්ධ වෙමු. එහි දී බටහිර දැනුම ඔස්සේ අප මත පටවන ආධිපත්‍යයට ද විරුද්ධ වෙමු. බටහිර ආර්ථික හා දේශපාලන ආධිපත්‍යයට විරුද්ධවන, එහෙත් සංස්කෘතික ආධිපත්‍යයට එකඟවන මාක්ස්වාදීන් ප්‍රගතිශීලි වන්නේත්, සංස්කෘතික ආධිපත්‍යයට ද විරුද්ධවන අප වැන්නන් ජාතිවාදීන්, ආගමික මූලධර්මවාදීන්, යුදවාදීන්, අන්තවාදීන් වන්නේත් බටහිර සංස්කෘතික ආධිපත්‍යයෙහි ම කොටසක් වූ දැනුම් ආධිපත්‍යය ඔස්සේ ය. බටහිර දැනුම, විශේෂයෙන් ම ඊනියා සමාජයීය විද්‍යා දැනුම විසින් බටහිර සංස්කෘතික ආධිපත්‍යයට එරෙහි වන්නෝ එලෙස හංවඩු ගැසෙති.

බටහිර යටත්විජිතවාදයේ ආරම්භය ඇත්තේ පහළොස් වැනි සියවසේ පමණ ය. යුරෝපයේ නව චින්තනයක් ඇති වීම ඇරඹුණේ එකල ය. අපි මේ චින්තනය යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ලෙස නම් කරමු. ඒ චින්තනය එලෙස චින්තනයක් ලෙස හඳුනාගනු ලැබුණේ සිංහල බෞද්ධ චින්තනයෙහි බැවින් මෙරට තකතීරු සමාජයීය විද්‍යාඥයෝ ඒ ගැන නෑසූ කන්ව සිටිති. එවැන්නක් ඉංගිරිසි පොතක තබා දකුණු ඇමෙරිකාවේ ස්පාඤ්ඤ බසින් ලියැවුණු පොතකවත් නැති වීම ඇංකරයන්ට ප්‍රශ්නයකි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මුලින් ම ඇති වුයේ කතෝලික රටවල ය. එය කතෝලික සංස්කෘතියට විරුද්ධ වුව ද මුල දී එය ව්‍යාප්ත කිරීමේ අවස්ථාව ලැබුණේ කතෝලික ස්පාඤ්ඤයන්ට හා පෘතුගීසීන්ට ය. ගැලීලියෝ පඬිවරයා ද කතෝලික ඉතාලියේ ජීවත් වූ කතෝලිකයකු බව අමතක නොකළ යුතු ය. එමෙන් ම කොපර්නිකස් විද්වතා පෝලන්තයේ ඉපදී කතෝලික පූජකවරයකු වීමට පුහුණුව ලැබුවෙකි. එහෙත් ඔවුන් නොදැන සිටි කරුණක් විය. තමන් කතෝලිකයන් වුව ද කතෝලික චින්තනයට එරෙහිව යන චින්තනයක් බිහි කිරීමට දායක වෙමින් සිටි බව ඔවුහු නොදත්හ.

පෘතුගිසින් ලංකාව වැනි රටවලට පැමිණියේ බටහිර යටත්විජිතවාදය වෙනුවෙන් බව අමතක කරන්නා හොඳ සිහියෙන් සිටින්නෙක් නොවේ. පෘතුගීසි සංස්කෘතික ක්‍රියා කලාපය විසින් මෙරටට වෙන ම සංස්කෘතියක් හඳුන්වා දෙනු ලැබුවා පමණක් නොව අනෙක් සංස්කෘතීන් විනාශ කිරීමේ ව්‍යාපෘතියක් ද අරඹනු ලැබිණි. අද මෙරට ක්‍රියාත්මක වන බෞද්ධයන් හා වෙනත් අය ක්‍රිස්තියානියට හැරවීමේ ව්‍යාපාරයේ මුල ඇත්තේ එකල ඇරඹි කතෝලිකකරණයෙහි ය. කොළඹ විශ්ව විද්‍යාලයෙහි ම සමාජ විද්‍යාව උගන්වන සසංක පෙරේරා නමැත්තාට අනුව මෙරට සියළු දෙනාම ආගමකට හැරවූවෝ වෙති. මෙයින් ඔහු කියන්නේ අනෙක් බොහෝ රටවල ආගමකට හැරවූවන් නැති බව ද? ඒ රටවල මිනිසුන් යම් ආගමකට අයත් නම් ඒ සියළු දෙනා ම ආගම් කර්තෘවරු ද? ඔවුහු තම තමන්ගේ පුද්ගලික ආගම් අදහත් ද? අනෙක් අතට බටහිර ක්‍රිස්තියානි ඇසින් ලෝකය දෙස බලන මේ සමාජ විද්‍යාඥයා මිහිඳු මහා රහතන් වහන්සේ ආගමට හරවන්නකු ලෙස දකියි. බුදුහාමුදුරුවන් මිනිසුන් බුද්ධාගමකට හරවා නැත. ලෝකයාගේ හිත සුව පිණිස සැරි සැරීම හා දහම් දෙසීම යනු ආගමකට හැරවීමක් නොවන බව මම පසුගිය සතියේ ද පෙන්වා දුනිමි. ආගමකට හැරවීම යනු බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංකල්පයකි. මේ සංකල්පය මුලින් ම දැකගතහැකි වන්නේ බයිබලයේ පරණ ගිවිසුමෙහි ය. යුදෙව්වෝ තම දෙවියන් වහන්සේ අනෙක් අයට ද දීමේ ඊනියා බර කරට ගත්හ. වයිට් මෑන්ස් බර්ඩ්න් යනුවෙන් හැඳින්වෙන ලෝකය ශිෂ්ට කිරීමේ බර බටහිර සුදු මිනිසුන් බාර ගත්තේ මේ සම්ප්‍රදායෙහි

© Prof. Nalin De Silva

පිහිටමිනි. ලෝකය ශිෂ්ට කිරීම යනු සුද්දන්ට අනුව අන්කිසිවක් නොව ලෝකයා තම සංස්කෘතික ආධිපත්‍යය යටතට ගැනීම ය. එනම් තම ආගම්වලට හැරවීම ය. අද මෙරට අනුකාරක දීන පශ්චාත්නූතනවාදීන් ද මේ බර කරට ගෙන ඇත. එහෙත් කොන්දක් නැති මොවුන් බර වැඩි නිසා ම අල්ප දයනු බවට පත් වී ඇති අයුරු දැකගත හැකි ය. භාරතයේ පරිබ්‍රාජකයෝ හා මුනිවරු මිනිසුන් ආගමට හැරවූවෝ නොවෙති. මුළු ලෝකයම බටහිර ක්‍රිස්තියානි සංකල්ප ඔස්සේ දකින බටහිර සමාජ විද්‍යා අනුකාරකයෝ ද මෙරට බුද්ධිමත්තු වෙති. මෙරට ආගමකට හැරවීම පටන් ගත්තෝ කතෝලික පෘතුගීසීහු වෙති. එකල ධනවාදය හෝ ලෙනින් නිර්වචනය කරන අධිරාජ්‍යවාදය හෝ නොතිබුණ ද, ඒ සියල්ලටත් බටහිර විද්‍යාවට හා තාක්ෂණයටත් තෝතැන්න වූ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඇරඹී තිබුණි.

බටහිර සංස්කෘතියෙහි ආගමක් යනු මිනිසකුගේ පුද්ගලික දෙයක් බවට බොරු මතයක් ප්‍රචාරය කෙරෙයි. ඒ අතර ඊනියා සංවිධිත ආගම් ගැන ද කතා කෙරෙයි. යම් මට්ටමකට හෝ සංවිධානය නොවූ ආගමක් ලෝකයේ නැත. සංවිධිත ආගම් ගැන කතාව බොරු පණ්ඩිතමානී බටහිර සමාජ විද්‍යා කතාවක් වෙයි. ආගමක් යනු සංවිධිත වූවක් පමණක් නොව සංස්කෘතියක් ද වෙයි. සංස්කෘතියකට පුද්ගලික බවක් නැත. එය සමාජයීය වූවකි. අවුරුදු පන්සියයක් තිස්සේ බටහිර සංස්කෘතිය ලෝකය මත බලහාත්කාරයෙන් පැටවෙන්නේ අනෙක් සංස්කෘතීන් විනාශ කෙරෙමිනි. එහෙත් බටහිර සමාජ විද්‍යාව ඒ බවක් නොකියයි. අඩුම තරමින් බටහිර යටත්විජිතවාදය ගැන කියන විට සංස්කෘතික යටත්විජිතවාදය ගැන නොකියයි. අද අප මත පටවා තිබෙන සමස්ත අධ්‍යාපනය ම බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනයක් වෙයි. මෙරට විශ්ව විද්‍යාල තරම් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය පතුරුවන ආයතන තිබේ ද? විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන්, විශ්ව විද්‍යාල බවට පත්කිරීම මෙරට බටහිර සංස්කෘතික ආධිපත්‍යය පැතිරවීමේ අවසාන අදියර විය. අපේ රටේ පරිහාණිය වේගවත් වූයේ ඊනියා විවෘත ආර්ථිකයකින් පසුව නොව ඒ පිරිවෙන්වලින් සිංහල බෞද්ධ පඬිවරුන් බිහි කිරීම ඇණහිටීමෙන් පසුව ය. මේ විශ්ව විද්‍යාල දෙක තව තවත් වල පල්ලට යැවීමේ වැඩ පිළිවෙලක් මෙරට ක්‍රියාත්මක වෙයි. (අවශ්‍ය නම් එයට කුමන්ත්‍රණයක් යැයි කීව ද කම් නැත. කුමන්ත්‍රණ ක්‍රියාවලියක් යනු කිහිප දෙනකු පමණක් දන්නා බහුජනයා නොදන්නා එකඟතාවයක් මත ක්‍රියාත්මක කෙරෙන වැඩ පිළිවෙළකි. මේ කුමන්ත්‍රණ අද සිදුවන්නේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ අංගයක් ලෙස ය.) අවාසනාවකට එහි දී ශිෂ්‍යයෝ ද සහභාගි කර ගැනෙති. තමන් ඒ ක්‍රියාවලියට හවුල්වන බව ශිෂ්‍යයන් නොදැන සිටීම මෙහි අවාසනාවන්ත ම කරුණ වෙයි. විවෘත ආර්ථිකය මත පමණක් සියල්ල පැටවීම සංස්කෘතික යටත්විජිතවාදය අමතක කරවීමට උත්සාහ කරන්නන්ගේ තවත් පිළිවෙතකි.

කුමණ්ත්‍රණ නැතිව ද බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදය වර්ධනය වෙයි. යම් පද්ධතියක් සැකසීමෙන් පසුව මිනිස්සු ඒ තුළ ක්‍රියාත්මක වෙති. ඒ සඳහා විශේෂ ඇණවුම් අවශ්‍ය නොවේ. උදාහරණයක් ලෙස ඉහත කී පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පත්කිරීම ගනිමු. ඒ පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පත්කෙරුණේ එ ජා ප ආණ්ඩුවකින් නෙව පණස්හයේ ආණ්ඩුව විසිනි. පණස්හය සඟ වෙද ගුරු ගොවි කම්කරු ව්‍යාපාරයක් ලෙස හැඳින්වෙයි. එදා පණස්හයේ බලවේගයේ ටික දෙනකු විරුද්ධ වුව ද බොහෝ දෙනකුට අවශ්‍ය වූයේ පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පත්කිරීම ය. එයට හේතුව වූයේ ඒ වන විට බටහිර ක්‍රිස්තියානි විශ්ව විද්‍යාලවලට මෙරට සංස්කෘතියෙහි වැදගත් තැනක් අත්කර දී තිබීම ය. විශ්ව විද්‍යාල යනු බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආයතන බව බටහිරයෝ නොකියති. ඒ ආයතන නිර්සංස්කෘතික ආයතන ලෙස බොහෝ දෙනා දකිති. ඒ බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය අනාගමික රාජ්‍ය ලෙස දකින ආකාරයට ය. ඒ සියල්ල එසේ දැකීමට බටහිර සංස්කෘතිය විසින් මිනිස්සු පෙළඹවෙති. බටහිර සමාජ විද්‍යාව හා බටහිර දේශපාලන විද්‍යාව ඒ සඳහා අවශ්‍ය දැනුම සපයයි. විශ්ව විද්‍යාල නිර්සංස්කෘතික ආයතන ලෙසත් බටහිර දැනුම නිර්සංස්කෘතික දැනුමක්, ඊනියා වාස්තවික (ඔබ්ජෙක්ටිව්) දැනුමක්, ලෙසත් දුටු සිංහල බෞද්ධයෝ ම විශ්ව විද්‍යාලවලට ඇති සමාජ තත්වයත් දැක තම ආයතන වූ පිරිවෙන්, විශ්ව විද්‍යාල බවට පත්කරන ලෙස ඉල්ලා සිටියහ. තමන් කරන්නේ කුමක් ද යන්න ගැන වැටහීමක් සිංහල බෞද්ධයනට එදා නොතිබුණේ ඔවුන්ගේ ම වූ ප්‍රවාද හා දැනුමක් නොතිබීම හේතුකොටගෙන ය. පිරිවෙන්, විශ්ව විද්‍යාල බවට පත්කිරීමට කරන ලද ඉල්ලීම හෝ ඒ සඳහා දැක්වූ උද්‍යෝගය හෝ ඉල්ලන් කෑමක් විය. තමන් ඉල්ලන්නේ බෞද්ධ ආයතන ක්‍රිස්තියානි ආයතන බවට පත්කිරීමට යැයි බෞද්ධයෝ එදා නොදැන සිටියහ. අද ද වැඩි දෙනා නොදනිති. කළ යුතුව තිබුණේ පිරිවෙනට විශ්ව විද්‍යාල අවශෝෂණය කර ගැනීම ය. එහෙත් කෙරුණේ විශ්ව විද්‍යාල තුළ පිරිවෙන් දියකර හැරීම ය. අද ශිෂ්‍යයෝ කැලණිය හා ජපුර ගැන මිස විද්‍යාලංකාර හා විද්‍යෝදය ගැන නොදනිති. විද්‍යෝදය ජපුරක් කිරීමෙන් කළ නපුර අපමණ ය. මේ ශිෂ්‍යන්ගෙන් ඇතැමකුට විද්‍යාලංකාර පිරිවෙනෙහි නිර්මාතෘ හිමිපාණන් වහන්සේ නමින් විශ්ව විද්‍යාලයෙහි නම් කෙරී

© Prof. Nalin De Silva

ඇති ධර්මාලෝක ශාලාව ලංකාවට තුට්ටු දෙකක වැඩක් නැති (ඇත්තට ම අවැඩක් කර ඇති) ලෙනින් කෙනකුගේ නමින් ලෙනින් ශාලාව වෙයි.

(මතු සම්බන්ධයි)

© Prof. Nalin De Silva